සෑම තැනක දීම
සෑම අවස්ථාවක දීම
ලියාපදිංචි වන්න

# ඔබේ කෝවිඩ් ආරක්ෂණ(COVIDSAFE) සැලසුම

## 1. ඔබට COVIDSAFE සැලැසුමක් තිබේද?

ස්ථානීයව ක්‍රියාත්මක වන සෑම ව්‍යාපාරයකටම COVIDSAFE සැලැසුමක් තිබිය යුතුය. WorkSafe හා අවසර ලත් නිලධාරීන් විසින් වික්ටෝරියාව පුරා පරීක්ෂා කිරීම සිදු කරනු ලැබේ.

## 2. ඔබගේ අංශය සඳහා වන COVIDSafe සැකසුම් ගැන ඔබ දන්නේද?

එක් එක් අංශය සඳහා වන මාර්ගෝපදේශ **coronavirus.vic.gov.au/guidance-sectors** හි ඇත. එක් එක් අංශය සඳහා මාර්ගෝපදේශන පිටුවල, උපදෙස් සහ නිතර අසන ප්‍රශ්නවල ඇතුළත් වේ.

## 3. ඔබේ ව්‍යාපාරය COVIDSafe බව තහවුරු කර ගැනීමට ඔබ කර ඇත්තේ මොනවාද?

සේවකයන්ට මුහුණු ආවරණ වැනි පෞද්ගලික ආරක්ෂණ උපකරණ ලබා දීම, ඔබේ ව්‍යාපාර පරිශ්‍රයට ඇතුළු වන සියලු දෙනා ම ලියාපදිංචි වීමට දිරි ගැන්වීම, දෑත් සනීපාරක්ෂක ලබා දීම හා නිතර ස්පර්ෂ කෙරෙන මතුපිට විෂබීජහරණය කිරීම ආදිය මෙම කටයුතුවලට ඇතුළත් විය හැකිය.

## 4. ඔබේ COVIDSafe සැලැසුම යාවත්කාලීන කිරීමට වගකිව යුතු වන්නේ කවුද?

නව සීමා පැනවීම්වලට අනුගත වෙමින් සහ ඔබගේ සේවකයන්ගේ, කොන්ත්‍රාත්කරුවන්ගේ හා ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතා සැපිරෙන පරිදි ඔබගේ COVIDSafe සැලසුම නිතර සමාලෝචනය කර යාවත්කාලීන කළ යුතුය.

## 5. ඔබේ COVIDSafe සැලැසුම ගැන ඔබේ සේවකයන් දැන සිටින්නේද?

ඔබේ COVIDSafe සැලසුම හා ඔබ විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග ගැන සේවකයන් විසින් දැන සිටීම වැදගත්ය. ඔබේ ව්‍යාපාරය ආරක්ෂිතව පවත්වාගෙන යාමේ සහ අසනීපබවක් දැනේ නම් නිවසේ රැඳීමේ ඇති වැදගත්කම ඔවුන්ට අවබෝධ කරවීමට එය උපකාරී වනු ඇත. COVID-19 රෝග ලක්ෂණවලට උණ, ඇඟ සීතල වීම, කැස්ස, උගුරේ වේදනාව, හුස්ම ගැනීමේ අපහසුතා, නාසයෙන් දියර ගැලීම හෝ සුවඳ පිළිබඳ සංවේදනය නොමැති වීම ඇතුළත් වේ.

## 6. ඔබට QR කේතයක් තිබේද?

සෑම ව්‍යාපාරයක් විසින් ම වික්ටෝරියානු රජයේ කේත සේවාව භාවිත කළ යුතු අතර, සෑම ස්ථානයක දීම සෑම අවස්ථාවක දීම කොපමණ වේලාවක් පරිශ්‍රයේ රැඳෙන්නේද යන්න නොසලකමින් ගනුදෙනුකරුවන් හා කාර්යමණ්ඩලය ලියාපදිංචි වන බව තහවුරු කර ගත යුතුය.එය නොමිලේ ලැබෙන, භාවිත කිරීමට පහසු, COVID-19 ව්‍යාප්තිය වැළැක්වීමට උපකාරී වන්නකි. ලියාපදිංචි වීම සඳහා coronavirus.vic.gov.au/QRcode වෙත යන්න.

## 7. ගනුදෙනුකරුවන්ට නිවැරදි දෙය කිරීමට උපකාරී වීම සඳහා වන සළකුණු හා පෝස්ටර් යනාදිය තවත් ලබා ගැනීමට ඔබ කැමතිද?

ඔබේ ව්‍යාපාරය සඳහා සළකුණු හා පෝස්ටර් හා ස්ටිකර් පහතින් ලබා ගන්න. **coronavirus.vic.gov.au/signs-posters-and-templates**

## 8. ඔබට වෙනත් භාෂාවකින් තොරතුරු අවශ්‍යද?

Business Victoria හොට්ලයින් අංකය වන 13 22 15 ඔස්සේ ඇමතීමෙන් සහ coronavirus.vic.gov.au/translated-information-about-coronavirus-covid-19 වෙබ් අඩවිය ඔස්සේ ව්‍යාපාර සඳහා වන සැලසුම පිළිබඳ තොරතුරු භාෂා ගණනාවකින් ලබා ගත හැකිය.

**ඔබේ COVID-19 එන්නත වෙන් කරවා ගැනීමට**
**www.coronavirus.vic.gov.au/vaccine.**

VICTORIA
State Government

# ඔබ තමාගේ සේවකයන් හා ගනුදෙනුකරුවන් ආරක්ෂිතව තබා ගන්නේ මෙමගිනි.

| | | | |
|---|---|---|---|
| **ව්‍යාපාරයේ නම:** | | | |
| **ලිපිනය:** | | | |
| **සැලසුම සම්පූර්ණ කරන ලද දිනය:** | | **තනතුර:** | |
| **සමාලෝචනය කළ දිනය:** | | **මීළඟ සමාලෝචනය:** | |

## ශාරීරික දුරස්ථතාව පවත්වා ගැනීම

| අවශ්‍යතා හා නිර්දේශ | ක්‍රියාමාර්ග |
|---|---|
| ඔබ විසින් අදාළ ඝණත්ව භාගයන් අදාළ කර ගත යුතුය. එක් එක් ප්‍රදේශයෙහි කෙතරම් පිරිසකට ආරක්ෂිතව සිටිය හැකි දැයි පරීක්ෂා කිරීමට ඔබේ අංශයේ මාර්ගෝපදේශන බලන්න. උදාහරණයක් ලෙස ඔබට 30m² ප්‍රමාණයේ ව්‍යාපාර ස්ථානයක් ඇත්නම්, වර්ග මීටර් දෙකේ නීතිය යටතේ එහි 15 දෙනෙකුට සිටිය හැකිය. | ඔබගේ අංශය සඳහා වන ඝණත්ව භාගය යනු කුමක්ද?<br><br>ඝණත්ව භාගය සමග අනුගත වීමට ඔබ සිදු කරන්නේ මොනවාද?<br><br>ඔබ ඇතුළුවීමේ දොරටුවේ සංඥාවක් තබා තිබේද?<br><br>ඔබේ ඝණත්ව භාගය නොඉක්මවීමට වගකිව යුතු වන්නේ කවුද? |
| හැකි සෑම තැනක දීම සේවකයන් හා අමුත්තන් අතර මීටර් 1.5ක ශාරීරික දුරස්ථතාව පවත්වා ගැනීමට උත්සාහ කරන්න. | පුද්ගලයන් වැඩ කරන ස්ථානයට ඇතුළුවන විට, ඇතුළේ ගමන් කරන විට හා පිට වන විට සෙනග එක්රැස් වීම නැවැත්වීමට ඔබට අවශ්‍යද?<br><br>මීටර් 1.5ක් දුරින් සිටීමට පුද්ගලයින් දිරි ගන්වන, පොළව මත කරන සළකුණු හෝ ස්ටිකර් ඔබ භාවිත කරන්නේද? |
| ශාරීරික දුරස්ථ බව පවත්වා ගැනීමට ඔබ විසින් සේවකයන්ට පුහුණුව ලබා දිය යුතුය. දැනට පවත්නා COVIDSafe සැකසුම් අවබෝධ කර ගැනීම ද මෙයට ඇතුළත් විය යුතුය.<br><br>මෙය **coronavirus.vic.gov.au** වෙතින් ලබා ගත හැකිය. | ශාරීරික දුරස්ථතාව පවත්වා ගැනීමේ ඇති වැදගත්කම ඔබේ සේවකයන්ට අවබෝධ වන බව තහවුරු කර ගැනීමට ඔබ කර ඇත්තේ මොනවාද? |

## මුහුණු ආවරණයක් පැළඳීම

| අවශ්‍යතා හා නිර්දේශ | ක්‍රියාමාර්ග |
|---|---|
| සියලු සේවකයන් **coronavirus.vic.gov.au/face-masks** හි දක්වා ඇති වත්මන් මුහුණු ආවරණ අවශ්‍යතාවලට අනුකූල වන බව ඔබ විසින් තහවුරු කර ගත **යුතුය.**<br><br>අවශ්‍යතා කාලීනව වෙනස් විය හැකිය. | ඔබේ අංශය සඳහා ඇති මුහුණු ආවරණ අවශ්‍යතා ගැන ඔබේ සේවකයන්ට අවබෝධයක් තිබේද?<br><br>ඔබ තමාගේ සේවකයන්ට මුහුණු ආවරණ සපයනවාද? |

| | |
|---|---|
| පෞද්ගලික ආරක්ෂණ උපකරණ (PPE) නිවැරදිව සකසා ගන්නේ, භාවිත කරන්නේ හා බැහැරලන්නේ කෙසේද යන්න ගැන ඔබ විසින් පුහුණුව හා තොරතුරු ලබා දිය යුතුය.<br><br>නැවත නැවත භාවිත කෙරෙන මුහුණු ආරවණ සෑම දිනක්ම භාවිතයෙන් අනතුරුව සේදිය යුතු බව ඔබේ වකයන්ට දැනුම්දිය යුතුය. කෙසේ වෙතත් දවස ඇතුළත දී මුහුණු ආවරණය කිලිටි වුවහොත් හෝ තෙත් වුවහොත් වහාම එය ඉවත් කර පිරිසිදු මුහුණ ආවරණයක් පැළඳ ගත යුතුය. | PPE භාවිත කරන්නේ කෙසේද යන්නට වගකිව යුතු වන්නේ කවුදැයි ඔබේ සේවකයන්ට අවබෝධයක් ඇති බව තහවුරු කර ගන්න? |

## යහපත් සනීපාරක්ෂක පුරුදු පවත්වා ගැනීම

| අවශ්‍යතා හා නිර්දේශ | ක්‍රියාමාර්ග |
|---|---|
| පොදුවේ පරිහරණය කරන ස්ථාන පිරිසිදු කිරීමට හා විෂබීජනාශනය කිරීමට ඔබ විසින් උත්සාහ කළ **යුතුය**. දොර අගුලු, දුරකථන වැනි නිතර ස්පර්ෂ කෙරෙන මතුපිට මෙයට ඇතුළත් වේ.<br><br>ඔබ විසින් පහත දැක්වෙන දේ කළ යුතුය:<br>• පිරිසිදුකාරක හා විෂබීජනාශක ඇතුළු සුදුසු පිරිසිදු කිරීමේ නිෂ්පාදන යොදා ගනිමින් නිතර ස්පර්ෂ කෙරෙන මතුපිට පිරිසිදු කිරීම.<br>• වැඩ මුරයන් අතර පිරිසිදු කිරීම. | ඔබ දොර අගුලු, කවුන්ටර් හා අත්වැටවල් ඇතුළුව නිතර ස්පර්ෂ කෙරෙන මතුපිට දිනකට දෙවරක් පිරිසිදු කර විෂබීජහරණය කරනවාද?<br><br>වැඩමුර අතර පිරිසිදු කිරීම සඳහා වගකිව යුතු වන්නේ කවුද? |
| බොහෝ දෙනා පරිහරණය කරන අවකාශවල ඔබ විසින් පිරිසිදු කිරීමේ ලොග් පොතක් ප්‍රදර්ශනය කළ යුතුය. | ඔබේ පිරිසිදු කිරීමේ ලොග් පොත ඇත්තේ කොහේද? |
| සියලුම සේවකයන් වෙනුවෙන් ඔබ සබන් හා දෑත් සනීපාරක්ෂක තැබිය යුතු අතර නිතර දෑත් සේදීමට දිරිගැන්වීය යුතුය. | දෑත් සෝදන සෑම ස්ථානයක ම සබන් හා වතුර තිබේද?<br><br>ගනුදෙනුකරුවන්ට, ඩිලිවරි කරන්නන්ට, කොන්ත්‍රාත්කරුවන්ට හා කාර්යමණ්ඩලයට ඇතුළු වන විට දෑත් පිරිසිදු කර ගැනීමට තිබේද? |

## සේවකයන් අසනීප වුවහොත් වාර්තා තබා ගෙන කඩිනමින් කටයුතු කරන්න.

| අවශ්‍යතා හා නිර්දේශ | ක්‍රියාමාර්ග |
|---|---|
| ඔබේ සේවකයන් අසනීප වුවහොත්, රෝග ලක්ෂණ කෙතරම් සුළු වුවත් පරීක්ෂා කරවාගෙන නිවසේ රැඳීමට ඔබ උපකාර කළ **යුතුය**. | COVID-19 රෝග ලක්ෂණ මොනවාදැයි ඔබ දන්නවාද?<br><br>සේවකයෙකුට රෝග ලක්ෂණ ඇත්නම්, පරීක්ෂා කරගෙන නිවසේ රැඳිය යුතු බව ඔවුන් දන්නවාද? |
| ඇති විය හැකි වසංගත කළමනාකරණය කිරීම සඳහා ඔබ විසින් ව්‍යාපාර හදිසි අවස්ථා සැලැස්මක් සකස් කළ **යුතුය**. මෙයට පහත දැක්වෙන දේ ඇතුළත් වේ:<br>• වැඩ කරන අතර තුර සේවකයෙකු තහවුරු කර ගත් ආසාදිතයකු හෝ සමීප ආශ්‍රිතයෙකු බවට දැන් වුන හොත් එවැනි අවස්ථාවල දී ප්‍රතිචාර දැක්වීමට සැලැස්මක්.<br>• තහවුරු කරන ලද ආසාදිතයෙකු සිටින අවස්ථාවක වැඩ කරන ස්ථානය (හෝ කොටසක්) පිරිසිදු කිරීම පිළිබඳ සැලැස්මක්.<br>• ඔබේ සේවා ස්ථානයේ COVID-19 සහිත තැනැත්තෙක් වේ නම් 13 23 60 ඔස්සේ සෞඛ්‍ය දෙපාර්තමේන්තුව හා WorkSafe Victoria සම්බන්ධ කර ගැනීමට සැලැස්මක්.<br>• සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් සේවා ස්ථානය වසා දමන ලෙස ඔබට උපදෙස් දුන්නොත් ඒ පිළිබඳ සැලැස්මක්.<br>• සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබීමෙන් පසු ඔබේ වැඩ කරන ස්ථානය නැවත විවෘත කිරීමට සැලැස්මක්. | ඔබ වැඩ කරන ස්ථානයේ සිටින සියලු කාර්ය මණ්ඩලය හා කොන්ත්‍රාත්කරුවන් ගැන වාර්තා පවත්වා ගන්නේ කෙසේද?<br><br>ඔබේ කාර්ය මණ්ඩලයට හා සැපයුම්කරුවන්ට නිරෝධායනය වීමට හා පරීක්ෂාවන් සිදු කර ගැනීමට අවශ්‍ය වුවහොත් ඔබ කඩිනමින් ඔවුන් සම්බන්ධ කර ගන්නේ කෙසේද?<br><br>ඔබේ සේවා ස්ථානයේ COVID-19 සහිත තැනැත්තෙක් වේ නම් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව හා WorkSafe Victoria අමතන්නේ කවුද? |

| | |
|---|---|
| **සෑම ව්‍යාපාරයක් විසින් ම Service Victoria යෙදවුම ඔස්සේ වික්ටෝරියානු රජයේ කේත සේවාව (සීමා සහිත ව්‍යතිරේකයන් සහිතව) භාවිත කළ යුතුය.**<br>**කිසියම් අමුත්තෙකුට ලියාපදිංචි වීමට නොහැකි නම්, තමාගේ සුහුරු දුරකථනය, ටැබ්ලටය හෝ පරිගණකය භාවිත කරමින් ඔවුන් ලියාපංදිංචි කරවීමට Service Victoria ලියාපදිංචි සේවාව මගින් අවස්ථාව ලබා දේ.**<br>**එය නොමිලේ ලැබේ, කඩිනම්ය, භාවිතය පහසුය.** | **coronavirus.vic.gov.au/register-to-use-vic-gov-qr-code-service ඔස්සේ වික්ටෝරියානු රජයේ QR කේත සේවාවේ ලියාපදිංචි වන්න.**<br>**වසංගත තත්ත්වයක් ඇති වුවහොත්, මෙමගින් කඩිනමින් හා කාර්යක්ෂමව ආශ්‍රිතයින් සෙවීම සහ වයිරසය පැතිරීම නැවැත්වීම කළ හැකිය.**<br>**සියලු කාර්ය මණ්ඩලය, කොන්ත්‍රාත්කරුවන්, ගනුදෙනුකරුවන් හා අමුත්තන් ලියාපදිංචි වන බව තහවුරු කර ගන්න.** |

## සංවෘත ස්ථානවල කටයුතු කිරීමෙන් වැළකීම.

| අවශ්‍යතා හා නිර්දේශ | ක්‍රියාමාර්ග |
|---|---|
| ඔබ විසින් සේවකයන් සංවෘත අවකාශවල රැදෙන කාල සීමාව අඩු කළ යුතුය. පහත ආකාරයන්ගෙන් මෙය සිදු කළ හැකිය:<br>• එළිමහනේ වැඩ කිරීමට හැකියාව සැලසීමෙන්.<br>• පාරිභෝගිකයන්ට සත්කාර කිරීම, රැස්වීම්, තේ විවේකයන්, දිවා ආහාර විවේකයන් හා ලොකර් කාමර ඇතුළු ක්‍රියාකාරකම් හැකි තාක් දුරට එළිමහනේ සිදු කිරීමට කටයුතු කිරීම.<br>• ජනෙල් හා දොරවල් විවෘත කිරීම මගින් වාතාශ්‍රය සංසරණය වීම ඉහළ නැංවීම.<br>• වායුසමීකරණ පද්ධතිවල නැවුම් වාතය සංසරණය කාර්යක්ෂම කිරීම. | ඔබට දොරවල් හෝ ජනෙල් විවෘත කළ හැකිද නැත්නම් ක්‍රියාකාරකම් එළිමහනේ සිදු කළ හැකිද? |

## ශ්‍රම බලකා බුබුළු

| අවශ්‍යතා හා නිර්දේශ | ක්‍රියාමාර්ග |
|---|---|
| එඑක් වැඩපළක එකම සේවා මුරයක් සඳහා එකම සේවක කණ්ඩායමක් යෙදවීම ගැන සළකා බලන්න. ප්‍රායෝගික වන අවස්ථාවන් හි දී සේවා මුරයන්වල දී සේවකයන් එකිනෙකා හා මුසු වීම වැලැක්වීමට උත්සාහ කරන්න. | ඔබ පුද්ගලයන් සම්බන්ධතා පවත්වන පිරිස අඩු කරමින් ඔවුන් කණ්ඩායම් ලෙස තබා ගන්නේද?<br>වසංගත තත්ත්වයක් ඇති වුවහොත්, එය ඔබේ සියලු කණ්ඩායම්වලට පැතිරීම වළක්වන්නේ කෙසේද?<br>කණ්ඩායම් සඳහා වෙනස් දින වෙන්කර තිබේද? |

මෙම ලේඛනය මගින් කුඩා ව්‍යාපාරවලට COVIDSafe සැලසුමක් සකස් කර ගැනීමට මාර්ගෝපදේශයක් ලබා දෙයි.
ඔබේ කර්මාන්තය සඳහා වන නවතම අවශ්‍යතා සඳහා ඔබ **CORONAVIRUS.vic.gov.au** බලන බව තහවුරු කර ගන්න.

අපගේ පෞද්ගලිකත්වය පිළිබඳ ප්‍රතිපත්තියට අනුව ඔබ විසින් ලබා දෙන සියලු තොරතුරු රහසිගත වන අතර දක්වන ලද අරමුණු සඳහා පමණක් භාවිත වේ.

අපගේ පෞද්ගලිකත්වය පිළිබඳ ප්‍රතිපත්තිය ගැන වැඩිදුර තොරතුරු දැන ගැනීමට **icc@ecodev.vic.gov.au** වෙත ඊමේල් පණිවුඩයක් යොමු කරන්න නැත්නම් 13 22 15 ඔස්සේ Business Victoria අමතන්න.

**සෑම තැනක දීම**
**සෑම අවස්ථාවක දීම**
**ලියාපදිංචි වන්න**

ඔබේ COVIDSafe සැලසුම සඳහා උදව් ලබා ගැනීමට **CORONAVIRUS.vic.gov.au** වෙත යන්න, නැත්නම් **13 22 15**. ඔස්සේ Business Victoria අමතන්න. පරිවර්තක සේවාව ලබාගත හැකිය.

VICTORIA State Government

DJPR 13413